සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

011805

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2000 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப்பத்திர(உயர் தர)ப் பரீட்சை, 2000 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2000

| | |
|---|---|
| ව්‍යවහාරික ගණිතය I<br>பிரயோக கணிதம் I<br>**Applied Mathematics I** | **06**<br>**S** **I** |

පැ තුනයි / மூன்று மணித்தியாலம் / Three hours

ප්‍රශ්න **හයකට** පමණක් පිළිතුරු සපයන්න.

---

1. අංශුවක්, $A$ ලක්ෂ්‍යයක නිශ්චලතාවයේ සිට පටන්ගෙන, සරල රේඛාවක් දිගේ චලනය වෙයි; එහි ත්වරණය, ආරම්භයේ $2\ \mathrm{m\,s^{-2}}$ අගයේ සිට තත්පර 20 ක දී ශූන්‍යය කරා ඒකාකාරී ව අඩු වෙයි. ඊළඟට එය තවත් තත්පර 20 ක් නියත ප්‍රවේගයක් සහිත ව ද, අනතුරුව $4\ \mathrm{m\,s^{-2}}$ ඒකාකාර මන්දනයක් සහිත ව ද ගමන් කර $B$ ලක්ෂ්‍යයක දී නිශ්චලතාවයට පැමිණේ. $A$ සිට $B$ දක්වා අංශුවේ චලිතය සඳහා ත්වරණ-කාල ප්‍රස්තාරයක දළ සටහනක් අඳින්න.

මෙම ප්‍රස්තාරය භාවිතයෙන්

(i) උපරිම ප්‍රවේගයත්

(ii) මන්දනයෙන් චලනය වන කාල ප්‍රාන්තරයත්

සොයන්න.

ආරම්භයේ සිට පළමු තත්පර 20 තුළ දී, $t$ කාලයේ දී අංශුවේ වේගය $v = 2t - \dfrac{t^2}{20},\ t < 20,$ බව පෙන්වන්න.

මුළු ගමන සඳහා ප්‍රවේග-කාල ප්‍රස්තාරය අඳින්න. ඒ නයින්, අංශුව ගමන් කළ මුළු දුර සොයන්න.

2. (අ) $Oxy$ - තලයේ $P$ අංශුවක් චලනය වන්නේ, $t$ කාලයේ දී එහි ප්‍රවේගය,

$$\mathbf{v} = -\,\mathbf{i}\,a\omega \sin \omega t + \mathbf{j}\,a\omega \cos \omega t$$

වන පරිදි ය. මෙහි $a, \omega$ නියත වන අතර $\mathbf{i},\ \mathbf{j}$ මගින් $Ox,\ Oy$ සෘජුකෝණාස්‍ර කාටීසීය අක්ෂ දිගේ පිළිවෙළින් ගත් ඒකක දෛශික දක්වයි.

$t = 0$ වන විට අංශුව පිහිටුම් දෛශිකය $2a\mathbf{i}$ සහිත ලක්ෂ්‍යයෙහි ඇත. $t$ කාලයේ දී $P$ හි පිහිටුම් දෛශිකය, $\mathbf{r}$ සොයා $\mathbf{r} - a\mathbf{i}$ නියත විශාලත්වයකින් යුතු බව පෙන්වන්න. ඒ නයින්, $P$ හි පෙත හඳුන්වා දෙන්න.

$P$ අංශුව $O$ වෙත පළමුවෙන් ළඟාවන කාලය සොයන්න.

(ආ) $A$ සහ $B$ අංශු දෙකක්, පිළිවෙළින් $u\mathbf{i} + v\mathbf{j}$ සහ $-4\mathbf{i} + 3\mathbf{j}$ නියත ප්‍රවේග සහිත ව $Oxy$-තලයේ චලනය වෙයි. $A$ ට සාපේක්ෂ ව $B$ හි ප්‍රවේගය සොයන්න. කාලය $t = 0$ වන විට $A$ අංශුව $O$ මූලයේ ද, $B$ අංශුව $10\mathbf{i}$ පිහිටුම් දෛශිකය සහිත ලක්ෂ්‍යයේ ද ඇත; පසුව අංශු එකිනෙක ගැටෙයි.

(i) $v$ හි අගයත්, $A$ හි අඩුතම වේගයත් සොයන්න.

(ii) $t = 2$ වන විට ගැටීම සිදුවෙයි නම් $u$ හි අගය සොයන්න.

[ අනෙක් පිට බලන්න.

3. තිරසට $\alpha$ කෝණයකින් ආනත තලයක් මත $O$ ලක්ෂ්‍යයක සිට $P$ අංශුවක් ප්‍රක්ෂේප කරනු ලබන්නේ ආරම්භක $\mathbf{u}$ ප්‍රවේගය, තලය සමග $\theta\left(<\frac{\pi}{2}-\alpha\right)$ කෝණයක් සාදමින්, උපරිම බෑවුම් රේඛාව අඩංගු සිරස් තලයේ පිහිටන පරිදි වේ. $\tau$ කාලයකට පසුව අංශුව ආනත තලය සමග $M$ ලක්ෂ්‍යයක දී ගැටෙයි නම්, එවිට එහි පිහිටුම් දෛශිකය

$$\mathbf{r}=\mathbf{u}\,\tau+\frac{1}{2}\mathbf{g}\,\tau^{2}$$

මගින් දෙනු ලබන බව පෙන්වන්න; මෙහි $\mathbf{g}$ යනු ගුරුත්වජ ත්වරණයයි.

මෙම දෛශික සමීකරණය නිරූපණය කරමින් $OLM$ ත්‍රිකෝණය අඳින්න.

මෙම රූපසටහන භාවිතයෙන්, හෝ අන් ක්‍රමයකින්, $\tau=\dfrac{2u\sin\theta}{g\cos\alpha}$ බව පෙන්වා, $|\mathbf{r}|$ සොයන්න.

ආනත තලය මත ඉහළට උපරිම පරාසය වූ $R$ ගෙන දෙන $\theta$ හි අගය, $\theta=\dfrac{\pi}{4}-\dfrac{\alpha}{2}$ බව අපෝහනය කර $R$ හි අගය සොයන්න.

තව දුරටත්, $R$ ගෙන දෙන $P$ හි මෙම පෙත සඳහා

(i) පියාසර කාලය, $T=\dfrac{\sqrt{2}\,u}{g\left(\cos\dfrac{\alpha}{2}+\sin\dfrac{\alpha}{2}\right)}$ බවත්,

(ii) $R=\dfrac{gT^{2}}{2}$ බවත්,

පෙන්වන්න.

4. ස්කන්ධය $M$ වූ $R$ අංශුවක්, සුමට තිරස් සෘජුකෝණාස්‍රාකාර මේසයක් මත නිශ්චලව ඇත. එය, සැහැල්ලු අවිතන්‍ය තන්තු දෙකකින්, ස්කන්ධ පිළිවෙළින් $m, m'(m'>m)$ වූ $P, Q$ අංශු දෙකකට ඈඳා ඇත. මේසයේ දාර දෙකක පවිකළ $L, N$ කුඩා සුමට කප්පි දෙකක් උඩින් තන්තු යමින්, $P, Q$ අංශු සිරස් ව එල්ලෙන අතර, $LRN$ රේඛාව මේසයේ සම්මුඛ පැති දෙකකට සමාන්තර වෙයි. තන්තු නොබුරුල් ව තිබිය දී පද්ධතිය නිශ්චලතාවයේ සිට මුදා හරිනු ලැබේ. $Q$ අංශුව $x$ දුරක් චලනය වීමෙන් අනතුරුව අප්‍රත්‍යාස්ථ ගෙබිමක් සමග ගැටේ. $P$ අංශුව ඉහළ නගින අතිරේක $y$ දුර,

$$y=\frac{(M+m)\,(m'-m)\,x}{m(M+m+m')}$$

මගින් දෙනු ලබන බව පෙන්වන්න.

$P$ වැටීම නිසා, $Q$ නැවත ගැස්සී චලනය වීමට පටන්ගත් පසු එය ඉහළ නගින දුර

$$\left(\frac{M+m}{M+m+m'}\right)^{2}x$$

බව තව දුරටත් පෙන්වන්න.

[ $P, Q, R$ අංශු කිසිවක් කප්පි සමග නොගැටෙන බව උපකල්පනය කෙරේ.]

5. සැහැල්ලු ප්‍රත්‍යාස්ථ $OP$ දුන්නක $O$ එක කෙළවරක් අචල ලක්ෂ්‍යයකට සවිකර ඇත. $P$ අනික් කෙළවරට ස්කන්ධය $m$ වූ කුඩා තැටියක් සම්බන්ධ කර ඇත; දුන්න සිරස් ව සහ $O$ ට පහළින් $P$ ඇති සමතුලිත පිහිටීමේ දී දුන්නේ විතතිය $a$ වෙයි. $t=0$ කාලයේ දී, ස්කන්ධය $2m$ වූ අංශුවක් සීරුවෙන් තැටිය මත තබනු ලැබේ. $t$ කාලයේ දී දුන්නේ විතතිය $x$ වෙයි නම්,

$$\frac{d^2x}{dt^2}+\frac{g}{3a}(x-3a)=0$$

බව පෙන්වන්න.

$x=3a+A\cos\omega t+B\sin\omega t$ ලෙස ලිවීමෙන් $A$ සහ $B$ නියත වල අගයන් සොයන්න; මෙහි $\omega^2=\frac{g}{3a}$ වෙයි.

දුන්නේ උපරිම විතතිය $5a$ බව පෙන්වා, මෙය ඇති වන විට $t$ හි අගය සොයන්න.

තැටියෙන්, අංශුව මත ඇති කෙරෙන බලය සොයා, අංශුව තැටිය සමග ස්පර්ශව ම පවතින බව සත්‍යාපනය කරන්න.

6. එක එකක බර $W$ සහ දිග $2a$ වූ $AB$, $BC$ සමාන ඒකාකාර ඉනිමං දෙකක් $B$ හි දී සුමට ලෙස අසවු කර, $A$ සහ $C$ දෙකෙළවර රළු තිරස් ගෙබිමක් මත නිශ්චල ව ඇත. $A$ සහ $C$ දෙකෙළවරේ දී ම ඝර්ෂණ සංගුණකය $\mu$ වෙයි.

බර $w$ වූ මිනිසෙක් $AB$ මත $A$ සිට $x$ දුරකින් සිටින අතර $A\hat{B}C$, $2\theta$ වෙයි. පිළිවෙළින් $A$ සහ $C$ හි දී අභිලම්බ ප්‍රතික්‍රියා වූ $R_A$ සහ $R_C$ සොයා $R_C<R_A$ බව පෙන්වන්න.

$x$ ක්‍රමයෙන් වැඩි කළේ නම්, ඉනිමඟ පළමුවෙන් ලිස්සා යන්නේ $C$ හි දී බව අපෝහනය කරන්න.

සමතුලිතතාව සීමාකාරී වන විට

$$x=\frac{2aW\,(2\mu-\tan\theta)}{w\,(\tan\theta-\mu)}$$

බවත් පෙන්වන්න.

මෙහි $\mu<\tan\theta<2\mu$ බව දී ඇත.

7. (අ) $Ox$, $Oy$ සෘජුකෝණාස්‍ර කාටීසිය අක්ෂ දිගේ ඒකක දෛශික පිළිවෙළින් $\mathbf{i}$, $\mathbf{j}$ වෙයි. අංශුවක් මත ක්‍රියා කරන $\mathbf{P}$ සහ $\mathbf{Q}$ බල දෙකක් පිළිවෙළින් $4\mathbf{i}+3\mathbf{j}$ සහ $-3\mathbf{i}-4\mathbf{j}$ දෛශික වලට සමාන්තර වෙයි. බල දෙකේ සම්ප්‍රයුක්තය, විශාලත්වය $7\text{ N}$ වූ $\mathbf{i}$ දෛශිකයේ දිශාවට ක්‍රියාකරන බලයකි. $\mathbf{P}$ සහ $\mathbf{Q}$ හි විශාලත්ව ගණනය කරන්න.

(ආ) අරය $a$ සහ බර $W$ වූ ඒකාකාර ගෝලයක්, තිරසට ආනතිය $\alpha$ වූ අචල සුමට තලයක නිශ්චලතාවයේ තබා ඇත්තේ ගෝල පෘෂ්ඨයේ ලක්ෂ්‍යයකට එක් කෙළවරක් ද, තලයේ ලක්ෂ්‍යයකට අනික් කෙළවර ද ඈඳූ, දිග $l$ වූ සැහැල්ලු අවිතන්‍ය තන්තුවක ආධාරයෙනි. තලය සමග තන්තුව සාදන $\theta$ කෝණය සොයන්න.

ගෝලය මත ක්‍රියා කරන බල සඳහා බල ත්‍රිකෝණයක් නිර්මාණය කරන්න.

මෙම බල ත්‍රිකෝණය භාවිතයෙන් හෝ අන්ක්‍රමයකින්,

(i) තන්තුවේ ආතතිය $\dfrac{W(l+a)\sin\alpha}{\sqrt{l^2+2al}}$ බව සහ

(ii) තලයෙන් ප්‍රතික්‍රියාව $\dfrac{W\cos(\alpha-\theta)}{\cos\theta}$ බව

පෙන්වන්න.

[ අනෙක් පිට බලන්න.

8. උස $h$ වූ ඒකාකාර ඝන ඍජු වෘත්ත කේතුවක ගුරුත්ව කේන්ද්‍රය, එහි අක්ෂය මත, ශීර්ෂයේ සිට $\frac{3h}{4}$ දුරකින් පිහිටන බව, අනුකලනයෙන් පෙන්වන්න.

දිග $l$ වූ සැහැල්ලු අවිතන්‍ය තන්තුවක එක කෙළවරක් මෙම කේතුවෙහි ශීර්ෂයට ද, අනිත් කෙළවර තල ආධාරකයෙහි පරිධියේ ලක්ෂ්‍යකට ද ඈඳා ඇත. ඊළඟට තන්තුව අවල සුමට නාදත්තක් උඩින් යවා ඇත. කේතුව එහි අක්ෂය තිරස් ව සහ තන්තුව නොබුරුල් ව නිශ්චලතාවයේ තිබෙයි නම්

(i) තන්තුවේ එක් එක් කොටස සිරස සමග $\theta = \sin^{-1}\left(\frac{h}{l}\right)$ කෝණයක් සාදන බව පෙන්වන්න;

(ii) තන්තුවේ ආතතිය, $l$, $h$ සහ කේතුවේ බර වූ $W$ ඇසුරෙන් සොයන්න;

(iii) කේතුවේ අධ-සිරස් කෝණය $\alpha$ නම්, $\cot\alpha = 2\tan\theta$ බව පෙන්වන්න.

9. සැහැල්ලු දඬු පහක් නිදහස් ලෙස සන්ධි කිරීමෙන්, රූපයේ දක්වෙන රාමු සැකිල්ල සාද ඇත. රාමු සැකිල්ල සිරස් තලයක සමතුලිතතාවේ තබා ඇත්තේ $A$ සන්ධිය අවල ලක්ෂ්‍යයකට නිදහස් ලෙස අසව් කිරීමෙනි. $AB$ සිරස් ද, $BC$ තිරස් ද වන අතර, $A\hat{D}B = 90°$ සහ $D\hat{B}C = D\hat{C}B = 30°$ වෙයි. $C$ හි දී 100 N භාරයක් එල්ලෙන අතර, තිරස් $P$ බලයක් $B$ හි දී $\overrightarrow{CB}$ දිශාවට ක්‍රියා කරයි.

$P$ සොයා, $A$ අසව්වේ ප්‍රතික්‍රියාවෙහි තිරස් සහ සිරස් සංරචක ලබා ගන්න.

රාමු සැකිල්ල සඳහා ප්‍රත්‍යාබල රූපසටහනක්, බෝ අංකනය භාවිතයෙන් අඳින්න.

ඒ නයින්, දඬු සියල්ලේ ම ප්‍රත්‍යාබල, ආතති සහ තෙරපුම් වෙන්කර දක්වමින්, නිර්ණය කරන්න.




10. (අ) $A$ සහ $B$ ස්වායත්ත සසම්භාවී සිද්ධි දෙකක සම්භාවිතා පිළිවෙළින් $a$ සහ $b$ වෙයි.

$P(A \cup B) = \frac{5}{6}$, $P(A \cap B) = \frac{1}{3}$ සහ $a > b$ බව දී ඇත්නම්, $a$ සහ $b$ හි අගයයන් සොයන්න.

(ආ) පෙට්ටියක් තුළ එකම තරමේ සුදු බෝල 5 ක් සහ කළු බෝල 2 ක් අඩංගු වෙයි. මෙම පෙට්ටියෙන් වරකට එක බෝලයක් බැගින් සසම්භාවී ලෙස ඉවතට ගැනීමේ ක්‍රීඩාවක $A$, $B$, $C$ ක්‍රීඩකයින් තිදෙනෙක්, වරකට එක් කෙනෙකු බැගින්, සහභාගී වෙති. තරඟය $A$ විසින් ආරම්භ කෙරෙන අතර, කළු බෝලයක් ඉවතට ගන්නා පළමු ක්‍රීඩකයා දිනයි. එක ක්‍රීඩකයෙක් දිනන තුරු, නම් සඳහන් පිළිවෙළට, ක්‍රීඩාව කරගෙන යනු ලැබේ. පහත දක්වෙන **එක් එක් නීතියට** අනුව, $A$, $B$, $C$ ක්‍රීඩාවෙන් දිනීමේ සම්භාවිතාව සොයන්න.

(i) ඉවතට ගැනෙන එක් එක් බෝලය ප්‍රතිස්ථාපනයකින් තොරව,

(ii) ඉවතට ගැනෙන එක් එක් බෝලය ප්‍රතිස්ථාපනය සහිත ව.

**ඉහත නීතිය (i) සිට (ii) ට වෙනස් කිරීමෙන් කාට වාසියක් සැලසෙයි ද?**